## මූලික පිරිවෙන් අවසාන විභාගය

# ඇගයීම් වාර්තාව

# 03-ත්‍රිපිටක ධර්මය

# 2019

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව මූලික පිරිවෙන් විෂය මාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයන් හයකින් ද සමන්විත වේ.

අ.පො.ස (සා.පෙළ) මට්ටමේ පවතින මූලික පිරිවෙන් අවසාන විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක අධ්‍යාපනය ලැබීමට හැකි මඟක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද  ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවේණාචාර්යවරු ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පළමු වරට මූලික පිරිවෙන් අවසාන විභාගය 2019 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තාව ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරුභවතුන්ට, පරිවේණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

මූලික පිරිවෙන් අවසාන විභාගයට අදාළ ත්‍රිපිටක ධර්මය විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පිරිවෙන් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය, විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු, I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය හා එම ප්‍රශ්නවල හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. පිරිවෙන් විභාගයේ ත්‍රිපිටක ධර්මය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අපේක්ෂකයන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු,  නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයින් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සංස්කෘත හා සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු  කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මාගේ හෘදයාංගම ස්තූතිය පළ කරමි.

2022.11.18

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එල්.එම්.ඩී. ධර්මසේන
විභාග කොමසාරිස් ජනරාල්

# පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක වන මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ජාතික අධ්‍යාපනයේ කේන්ද්‍රය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යාප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේධ යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබා දීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම යන මූලික දෑ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම සිරි ඝනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවි යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සම්ප්‍රදායික හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවී ව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට 1981 පවත්වන ලදී. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 135ක් විභාගය අසමත් විය.

වර්තමානයේ දී සාමාන්‍ය පෙළ විභාගය හා සම මට්ටමේ ලා සලකනු ලබන මෙම විභාගයේ දී අපේක්ෂයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් 02ක් වත් තෝරා ගත යුතු ය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂයයන් ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතුය. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌණ සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌණ සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළමුවරට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරින්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා තනන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතුවේවා! යි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | එල්. එම්. ඩී. ධර්මසේන<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා අධීක්ෂණය | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| සම්බන්ධීකරණය හා සංවිධානය | : | ඩී. ඩී. වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග) |
| විෂය සම්බන්ධීකරණය | : | ඩබ්. එස්. ඩී වීරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| සංස්කරණය | : | පූජ්‍ය රත්මලවිට චන්ද්‍රානන්ද හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය, බත්තරමුල්ල |
| ලේඛක මණ්ඩලය | : | එස්. එම්. රූපසිරි මයා<br>ත්‍රිපිටක ධර්මය(ප්‍රධාන පරීක්ෂක)<br>179/1, බක්මීගහකොටුව,<br>වැලමිටියාව,නාරම්මල<br><br>පූජ්‍ය රත්මලවිට චන්ද්‍රානන්ද හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය, බත්තරමුල්ල<br><br>පූජ්‍ය කළහේ පඤ්ඤානන්ද හිමි<br>පරිවෙණාධිපති<br>රණසිංහ ප්‍රේමදාස පිරිවෙන,<br>ගැමුණුපුර, දෙබර වැව,<br>තිස්සමහාරාමය |
| පරිගණක පිටපත සැකසුම | : | ඩී. ඒ. අයේෂා මධුවන්ති<br>(දත්ත සටහන් සහකාර) |
| පිටකවරය නිර්මාණය | : | ආර්. එම්. නිලුපුල් ශෙහාන් යසරත්න<br>(දත්ත සටහන් සහකාර) |

# පටුන

**පිටු අංකය**

**I කොටස**


**1. විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු** 2

**1.1 ත්‍රිපිටක ධර්මය විෂය අධ්‍යයනයේ අරමුණු** 2

**1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු** 3

1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 3

1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 3

1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය දිස්ත්‍රික්ක අනුව 4

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 5

**1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය** 6

1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 6

1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 7

1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 7

1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8


**II කොටස**


**2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු** 9

**2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු** 9

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 9

2.1.2 I ප්‍රශ්න පත්‍රය ( ප්‍රශ්න 1 සිට 40 දක්වා) 10

2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 14

2.1.4 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශතයක් ලෙස 15

2.1.5 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ නිගමන හා යෝජනා 16

**2.2. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු** 17

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 17

2.2.2 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුර ලකුණු දීමේ පටිපාටිය පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 18

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 33


**III කොටස**


**3 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා**

**3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා** 34

**3.2 ඉගෙනුම් ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා** 35

# I කොටස

## 1.0 විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 ත්‍රිපිටක ධර්මය විෂය අධ්‍යයනයේ අරමුණු

1. ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවත් ව හා යථාර්ථවාදීව කටයුතු කරන, නිවැරදි ප්‍රායෝගික වතාවත්වල යෙදෙන භික්ෂු හා ගිහි පරපුරක් බිහි කිරීම.

2. ජීවන ගමනේ දී මුහුණපාන අභියෝග ජයගැනීමට හා නිවැරදි යහපත් ජීවන රටාවක් ගොඩනඟා ගැනීමට බුදු දහමේ මූලික ඉගැන්වීම උපයෝගීකොටගෙන සිව්වනක් පිරිසේ යහපත් ආදර්ශ ද එක්කොට ගත් දැහැමි පරපුරකට මඟ පෙන්වීම.

3. නිවැරදි හා යහපත්, ආදර්ශවත්, යථාර්ථවාදී භික්ෂු ජීවිතයක් ගොඩනඟා ගැනීමට භික්ෂු විනය හා ශික්ෂාපද ප්‍රගුණ කිරීමට මඟ පෙන්වීම.

4. බෞද්ධ ත්‍රිපිටකාගත සූත්‍ර අධ්‍යයනයකොට භික්ෂු ජීවිතය සාර්ථක කරගැනීමටත් ගිහි ජනතාවට මඟ පෙන්වීමටත් ඒ තුළින් සුපෞරුෂයක් ගොඩනඟා ගැනීමටත් මඟ පෙන්වීම.

5. ධම්මපද ගාථා අධ්‍යයනයකොට ආදර්ශ සපයාගනිමින් භික්ෂු ජීවිතය සාර්ථක කර ගැනීමටත්, ගිහි ජීවිත සාර්ථක කර ගැනීමට ධර්ම දේශනා කිරීමටත් මඟ පෙන්වීම.

6. ශ්‍රී ලාංකේය හා බෞද්ධ සංස්කෘතික උරුමය හැඳින, ශාසනික උරුමය රැකගැනීමත්, ඒවා පවත්වා ගැනීමටත් අවශ්‍ය ආදර්ශ සපයන භික්ෂු හා ගිහි සිසු පිරිසක් බිහිකිරීම.

7. මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනඟා ගැනීමට භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

8. සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික සංවර්ධනය උදෙසා බෞද්ධ ඉගැන්වීම් උපයෝගීකොට ගෙන ප්‍රායෝගික භික්ෂු ජීවිතයක් ගොඩනඟා ගැනීමටත්, ගිහි ජනතාවට මඟ පෙන්වීමටත් අවශ්‍ය ශක්තිය ලබාදීම.

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 2204 | 25 | 2229 |
| ඉංග්‍රීසි | 12 | 0 | 12 |
| එකතුව | **2216** | **25** | **2241** |

**වගුව 1**

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පිරිවෙන් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 187 | 8.44 | 2 | 8 | 189 | 8.43 |
| B | 296 | 13.36 | 2 | 8 | 298 | 13.30 |
| C | 799 | 36.06 | 7 | 28 | 806 | 35.97 |
| S | 713 | 32.17 | 8 | 32 | 721 | 32.17 |
| W | 221 | 9.97 | 6 | 24 | 227 | 10.13 |
| එකතුව | **2216** | **100.00** | **25** | **100.00** | **2241** | **100.00** |

**වගුව 2**

### 1.2.3 පළමු වතාවට පෙනී සිටි පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 151 | 25 | 16.56 | 22 | 14.57 | 61 | 40.40 | 33 | 21.85 | 141 | 93.38 | 10 | 6.62 |
| ගම්පහ | 195 | 14 | 7.18 | 29 | 14.87 | 74 | 37.95 | 63 | 32.31 | 180 | 92.31 | 15 | 7.69 |
| කළුතර | 125 | 12 | 9.60 | 22 | 17.60 | 40 | 32.00 | 36 | 28.80 | 110 | 88.00 | 15 | 12.00 |
| මහනුවර | 252 | 34 | 13.49 | 44 | 17.46 | 91 | 36.11 | 69 | 27.38 | 238 | 94.44 | 14 | 5.56 |
| මාතලේ | 70 | 5 | 7.14 | 0 | 0.00 | 26 | 37.14 | 31 | 44.29 | 62 | 88.57 | 8 | 11.43 |
| නුවරඑළිය | 33 | 3 | 9.09 | 1 | 3.03 | 19 | 57.58 | 8 | 24.24 | 31 | 93.94 | 2 | 6.06 |
| ගාල්ල | 175 | 4 | 2.29 | 8 | 4.57 | 64 | 36.57 | 68 | 38.86 | 144 | 82.29 | 31 | 17.71 |
| මාතර | 162 | 11 | 6.79 | 25 | 15.43 | 66 | 40.74 | 42 | 25.93 | 144 | 88.89 | 18 | 11.11 |
| හම්බන්තොට | 97 | 5 | 5.15 | 16 | 16.49 | 37 | 38.14 | 28 | 28.87 | 86 | 88.66 | 11 | 11.34 |
| වවුනියාව | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 1 | 100.00 | 0 | 0.00 |
| මඩකලපුව | 3 | 1 | 33.33 | 1 | 33.33 | 1 | 33.33 | 0 | 0.00 | 3 | 100.00 | 0 | 0.00 |
| අම්පාර | 60 | 20 | 33.33 | 20 | 33.33 | 10 | 16.67 | 7 | 11.67 | 57 | 95.00 | 3 | 5.00 |
| ත්‍රිකුණාමලය | 16 | 0 | 0.00 | 0 | 0.00 | 2 | 12.50 | 12 | 75.00 | 14 | 87.50 | 2 | 12.50 |
| කුරුණෑගල | 236 | 15 | 6.36 | 25 | 10.59 | 68 | 28.81 | 96 | 40.68 | 204 | 86.44 | 32 | 13.56 |
| පුත්තලම | 45 | 0 | 0.00 | 3 | 6.67 | 14 | 31.11 | 23 | 51.11 | 40 | 88.89 | 5 | 11.11 |
| අනුරාධපුර | 138 | 7 | 5.07 | 19 | 13.77 | 38 | 27.54 | 54 | 39.13 | 118 | 85.51 | 20 | 14.49 |
| පොළොන්නරුව | 41 | 1 | 2.44 | 6 | 14.63 | 19 | 46.34 | 13 | 31.71 | 39 | 95.12 | 2 | 4.88 |
| බදුල්ල | 124 | 5 | 4.03 | 16 | 12.90 | 50 | 40.32 | 35 | 28.23 | 106 | 85.48 | 18 | 14.52 |
| මොණරාගල | 65 | 5 | 7.69 | 8 | 12.31 | 22 | 33.85 | 24 | 36.92 | 59 | 90.77 | 6 | 9.23 |
| රත්නපුර | 134 | 7 | 5.22 | 19 | 14.18 | 53 | 39.55 | 48 | 35.82 | 127 | 94.78 | 7 | 5.22 |
| කෑගල්ල | 118 | 15 | 12.71 | 14 | 11.86 | 51 | 43.22 | 30 | 25.42 | 110 | 93.22 | 8 | 6.78 |
| සමස්ත ප්‍රතිඵලය | 2241 | 189 | 8.43 | 298 | 13.30 | 806 | 35.97 | 721 | 32.17 | 2014 | 8987 | 227 | 10.13 |

වගුව 3

### 1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 7 | 0.31 | 2241 | 100.00 |
| 81 - 90 | 75 | 3.35 | 2234 | 99.69 |
| 71 - 80 | 196 | 8.75 | 2159 | 96.34 |
| 61 - 70 | 354 | 15.80 | 1963 | 87.59 |
| 51 - 60 | 483 | 21.55 | 1609 | 71.80 |
| 41 - 50 | 520 | 23.20 | 1126 | 50.25 |
| **31 - 40** | **353** | **15.75** | **606** | **27.04** |
| 21 - 30 | 170 | 7.59 | 253 | 11.29 |
| 11 - 20 | 76 | 3.39 | 83 | 3.70 |
| 01 - 10 | 7 | 0.31 | 7 | 0.31 |
| 00 - 00 | 0 | 0.00 | 0 | 0.00 |


වගුව 4

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- 31 - 40 පන්ති ප්‍රාන්තරය සලකා බලන විට,
මෙම විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 2241 අතුරෙන් 31- 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් සංඛ්‍යාව 353කි. එය ප්‍රතිශයක් වශයෙන් 15.75%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 606ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 27.04%කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය





**ප්‍රස්තාරය 1** ( RD/16 /5 / MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උ.දා :- මෙහි අපේක්ෂකයන් වැඩිම ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 11වෙනි ප්‍රශ්නයට වන අතර එහි ප්‍රතිශතය 87.12%කි. එමෙන්ම අපේක්ෂකයන් අඩුම ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 33වන ප්‍රශ්නයට වන අතර එහි ප්‍රතිශතය 18.94%කි.

### 1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණ මගින් පෙන්වා දී ඇත.

මෙහි 1 වන ප්‍රශ්නය අනිවාර්ය වුවද සුළු පිරිසක් එය තෝරාගෙන නැත. එයට පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 88.31%කි.

- 2,3,4 ප්‍රශ්න II කොටසටත් 5,6,7 ප්‍රශ්න III කොටසටත් අයත්ය.
- IIකොටසේ 2වන ප්‍රශ්නය අපේක්ෂකයන් 82.34% ක් තෝරාගෙන ඇති අතර, III කොටසේ 5වන ප්‍රශ්නය අපේක්ෂකයන් 80.78%ක් තෝරාගෙන ඇත.

**ප්‍රස්තාරය 2 (RD/ 16 / 2/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)**

### 1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




**ප්‍රස්තාරය 3 (RD / 16/ 2/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)**

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- මෙහි 2වන ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 10කි. මෙම ප්‍රස්තාරයට අනුව දෙවන ප්‍රශ්නය සඳහා,


0 - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 10න් 0 - 2 තෙක් ලකුණු ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 7.26%කි.

26% - 50% ප්‍රාන්තරයේ එනම් ලකුණු 10න් ලකුණු 3 - 5 තෙක් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 20.19%කි.

51 - 75% ප්‍රාන්තරයේ එනම් ලකුණු 6 - 7 තෙක් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 12.3%කි.

76 - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 8 - 10 තෙක් ලකුණු ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 60 .25%කි.

### 1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4 (RD/ 16/ 4 / MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- 2වන ප්‍රශ්නයේ එක් එක් කොටස සඳහා සාර්ථකව පිළිතුරු සැපයූ ප්‍රතිශතය එනම්, (i) අනුකොටස සඳහා 88%ක් ද (ii) අනුකොටස සඳහා 79%ක් ද (iii) අනුකොටස සඳහා 66%ක් ද වේ. එනම් (i) අනුකොටස සඳහා පහසුතාව 88%ක් ද (ii) අනුකොටස සඳහා පහසුතාව 79%ක් ද (iii) අනුකොටස සඳහා පහසුතාව 66%ක් ද වේ.

## II කොටස

## 2.0 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

## 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1.1 ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**I පත්‍රය - කාලය : පැය 01 යි.**

| |
|---|
| වරණ 4 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 40කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයීම කළ යුතුය.<br>එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි. |

## 2.1.2 I ප්‍රශ්න පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. "ඔබ වහන්සේගේ දහම් විස්තරය භික්ෂූන් වහන්සේලාට මනාව වැටහිණි. එසේ වුවත් දීර්ඝ දහම් විස්තරය අසා දොරකඩ සිටි මගේ පිට රිදෙන්නේ යැයි" බුදුරජාණන් වහන්සේ වදාළේ,
   (1) මහාකාශ්‍යප තෙරුන්ගේ ධර්මදේශනාවක් ඇසීමෙනි.
   (2) නන්දක තෙරුන්ගේ ධර්මදේශනාවක් ඇසීමෙනි.
   (3) අනුරුද්ධ තෙරුන්ගේ ධර්මදේශනාවක් ඇසීමෙනි.
   (4) නන්ද තෙරුන්ගේ ධර්මදේශනාවක් ඇසීමෙනි.

2. බුදුරජාණන් වහන්සේගේ රූප විලාසයෙහි දෙතිස් මහාපුරුෂ ලක්ෂණ අතර "සුඛුමච්ඡවී හොති" යන්නෙන් අදහස් වන්නේ,
   (1) රන්බඳු පැහැ ඇති බව ය.  (2) මනාව තැනුන පිට මැද ඇති බව ය.
   (3) දූවිලි නොරඳන සියුම් සම ඇති බව ය.  (4) ඉඳුනිල් පැහැ නෙත් ඇති බව ය.

3. අසමසම බුදුරජාණන් වහන්සේගේ අෂ්ටවිද්‍යා ඥාන අතරින් "මනොමය ඉද්ධි ඤාණය" තුළින් ප්‍රකට වන්නේ,
   (1) නාමරූප ධර්ම අනිත්‍යාදී වශයෙන් දැකීමේ හැකියාවයි.
   (2) අනුන්ගේ සිත් හා සිතිවිලි දැනගැනීමේ හැකියාවයි.
   (3) බොහෝ රූප මවා පෙන්වීමේ හැකියාවයි.
   (4) තමන් හා සමාන වෙනත් කයක් නිර්මාණය කිරීමේ හැකියාවයි.

4. "දරුව, සියලු සතුන් කෙරෙහි දඬු බහා තබා මම සිටියේ වෙමි. ප්‍රාණවධයෙන් නො වැළකුණු ඔබ තව ම නො නැවතුනෙහි" යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදාරන ලද්දේ,
   (1) රජ්ජුමාලා මෙහෙකාරියට ය.  (2) සුනීත සැඩොල් පුතුට ය.
   (3) පේසකාර දියණියට ය.  (4) අංගුලිමාලට ය.

5. සැරියුත් තෙරුන් වහන්සේ රහත්ඵලයට පත්වූයේ දීඝනඛ පිරිවැජියාට සූකරකත ලෙනේ දී බුදුරදුන් දේශනා කළ කිනම් සූත්‍රයක් ඇසීමෙන් ද?
   (1) සච්චවිභංග සූත්‍රය ඇසීමෙනි.  (2) වේදනා පරිග්ගහ සූත්‍රය ඇසීමෙනි.
   (3) ධම්මචක්කප්පවත්තන සූත්‍රය ඇසීමෙනි.  (4) ආපත්තිභය සූත්‍රය ඇසීමෙනි.

6. ගෞතම සම්බුද්ධ ශාසනයේ අග්‍රශ්‍රාවිකාවක වූ උප්පලවණ්ණා තෙරණිය ලැබූ අගතනතුර වූයේ,
   (1) විනයධර භික්ෂුණීන් අතර අගතනතුරයි.  (2) ඍද්ධිමත් භික්ෂුණීන් අතර අගතනතුරයි.
   (3) ධර්මකථික භික්ෂුණීන් අතර අගතනතුරයි.  (4) චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අගතනතුරයි.

7. අටුවාචාර්ය බුද්ධඝෝෂ මාහිමියෝ හෙළටුවා භාවිත කරමින් ත්‍රිපිටකය සඳහා පාලි අටුවා සම්පාදනය කළහ. ඉන් මජ්ඣිමනිකාය සඳහා ලියන ලද අටුවාව වන්නේ,
   (1) මනෝරථපූරණියයි.  (2) පරමත්ථජෝතිකාවයි.
   (3) සුමංගලවිලාසිනියයි.  (4) පපංචසූදනියයි.

8. වත් සමාදානය, මානත් පිරීම, අබ්භාන කර්මය යන විනය පිළිවෙත් මාලාව අනුගමනය කිරීමෙන් පමණක් පාරිශුද්ධත්වයට පත් විය හැකි ශික්ෂා ප්‍රඥප්තියක් වන්නේ,
   (1) සංඝාදිසේසාපත්තියයි.  (2) පාරාජිකාපත්තියයි.
   (3) පාචිත්තිය ආපත්තියයි.  (4) පාටිදේසනීය ආපත්තියයි.

9. මූලික බුද්ධ දේශනාව නවංගසත්ථුසාසනයකට බෙදා දක්වා ඇත. මෙහි එන ''අබ්භුතධම්ම'' යන අංගයෙන් දක්වා ඇත්තේ,
   (1) සියලුම ගාථා සහිත සූත්‍රයන් ය. (2) බෝසත් චරිතය පිළිබඳ කථාවන් ය.
   (3) ආශ්චර්යවත් කරුණු ඇතුළත් සූත්‍රයන් ය. (4) සතුට පළ කරමින් දේශනා කළ ගාථාවන් ය.

10. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් අවේලාවේ වීථි සංචාරයේ ආදීනව අතර එන ''සංකියො ච හොති පාපකෙසු ඨානෙසු'' යන්නෙන් අර්ථවත් වන්නේ,
   (1) තමාගේ ම රැකවරණය නැතිවෙයි. (2) ඔහුගේ ධනයේ ද රැකවරණය නැතිවෙයි.
   (3) බොහෝ දුක් කරදර ඔහු පසුපස එයි. (4) වැරදි අපරාධවලට සැකකරුවකු වෙයි.

11. පරාභව සූත්‍රයේ සඳහන් පිරිහීමේ දොරටු අතර
   'අසන්තස්ස පියා හොන්ති - සන්තෙ න කුරුතෙ පියං' යන ගාථාර්ධයෙහි අර්ථය වන්නේ,
   (1) අසත්පුරුෂයෝ ප්‍රිය කරති - සත්පුරුෂයෝ ප්‍රිය නො කරති.
   (2) අකුසලය ප්‍රියකරයි - කුසලය ප්‍රිය නොකරයි.
   (3) නිතර නිදනසුලු වෙයි - පිරිස් මැද ගැවසෙනසුලු වෙයි.
   (4) බොහෝ රන්රුවන් ඇතිවෙයි - තනි ව භුක්ති විඳිනු සුලු වෙයි.

12. ආපත්තිභය සූත්‍රයේ එන භික්ෂුවක හෝ භික්ෂුණියක විසින් දැනගත යුතු ආපත්ති භය සතර නිවැරදි ව දක්වා ඇති වරණය වන්නේ,
   (1) පාරාජිකා, ථුල්ලච්චය, පාටිදේසනීය, දුක්කට
   (2) පාරාජිකා, සංඝාදිසේස, පාචිත්තිය, පාටිදේසනීය
   (3) පාරාජිකා, පාටිදේසනීය, දුබ්භාසිත, පාචිත්තිය
   (4) පාරාජිකා, පාචිත්තිය, පාටිදේසනීය, දුක්කට

13. අභිධර්මයේ රූපපරමාර්ථ විග්‍රහයේ දී විසයරූප හතරක් දක්වා ඇත. එම විසයරූප නිවැරදි ව දක්වා ඇත්තේ,
   (1) පඨවි, ආපෝ, තේජෝ, වායෝ (2) උපචය, සන්තති, ජරතා, අනිච්චතා
   (3) රූප, ශබ්ද, ගන්ධ, රස (4) චක්ඛු, සොත, ඝාණ, ජිව්හා

14. නිවනෙහි පළමුවන පියවර වන සෝවාන් ඵලයට පත් තැනැත්තා පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය වන්නේ,
   (1) සෝවාන් ඵලයට පත් තැනැත්තා අනිවාර්යයෙන් නිවන් දකී.
   (2) සෝවාන් ඵලයට පත් තැනැත්තා කිසිදා අපායගාමී නොවේ.
   (3) සෝවාන් ඵලයට පත් තැනැත්තා ජන්ම හතක් ඇතුළත රහත් වෙයි.
   (4) සෝවාන් ඵලයට පත් තැනැත්තාට කාමරාග නොමැත.

15. පටාචාරා තෙරණින් වහන්සේ රහත් ඵලයට පත්වූයේ පැන් කෙණ්ඩියෙන් බිමට දැමූ ජලය ගලායාම අරමුණුකොට ගෙන ය. එම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ ඇයට වදාළ ගාථාවේ මුල් අර්ධය වන්නේ,
   (1) යො ච වස්සසතං ජීවෙ - අපස්සං උදයව්‍යයං
   (2) යො ච වස්සසතං ජීවෙ - කුසීතො හීන වීරියො
   (3) යො ච වස්සසතං ජීවෙ - දුප්පඤ්ඤො අසමාහිතො
   (4) යො ච වස්සසතං ජීවෙ - අපස්සං අමතං පදං

16. ධම්මපදයේ පාප වග්ගයේ එන ''මාප්පමඤ්ඤෙථ පාපස්ස'' යන ගාථා පාදයෙන් කියවෙන්නේ,
   (1) කුඩා වරදක් හෝ නොකළයුතු බවයි. (2) පාපය සුළුයැයි නොතැකිය යුතු බවයි.
   (3) පාපය බැහැර කළ යුතු බවයි. (4) සියලු පාපයෙන් වැළකිය යුතු බවයි.

17. පුහුදුන් පුද්ගලයාගේ සිත තුළ කෙලෙස් ක්‍රියාත්මක වන ආකාර තුනකි. ඉන් අනුසය අවස්ථාව ලෙස සැලකෙන්නේ,
   (1) කෙලෙස් අවදිව සිතතුළ ක්‍රියාත්මක අවධියයි.
   (2) කෙලෙස් නිදිගත් අවධියයි.
   (3) කෙලෙස් ශාරීරිකව හා මානසිකව ක්‍රියාත්මක අවධියයි.
   (4) කෙලෙස් නැති වී යන අවධියයි.

18. කායානුපස්සනා සතිපට්ඨානයෙහි එන සම්පජඤ්ඤ පබ්බයෙන් දැක්වෙන්නේ,
   (1) ඉරියව් පිළිබඳ ව භාවනා අරමුණින් ගෙන මෙනෙහි කිරීමයි.
   (2) ශරීරයේ කුණප කොට්ඨාස අරමුණු ලෙස ගෙන මෙනෙහි කිරීමයි.
   (3) සියලු කටයුතුවල දී සතරාකාර නුවණින් මෙනෙහි කිරීමයි.
   (4) හුස්ම ගැනීම හෙළීම අරමුණු වශයෙන් ගෙන මෙනෙහි කිරීමයි.

19. සමාජ දුක් ඇතිවන ආකාරය පැහැදිලි කරමින් "තණ්හාව හේතුවෙන් සෙවීම වේ. සෙවීම හේතුවෙන් ලැබීම වේ. ලැබීම හේතුවෙන් හොඳනරක තීරණය කිරීම වේ." යනාදී කරුණු සඳහන්වන සූත්‍රයක් වන්නේ,
   (1) මජ්ඣිමනිකායේ සල්ලේඛ සූත්‍රයයි. (2) සංයුත්තනිකායේ අචේලකස්සප සූත්‍රයයි.
   (3) දීඝනිකායේ මහානිදාන සූත්‍රයයි. (4) අංගුත්තරනිකායේ නිබ්බේධික සූත්‍රයයි.

20. කර්ම විපාක අඩු කිරීම හා ජනක කර්මයෙන් උපන් සැප වූ හෝ දුක් වූ හෝ ප්‍රවෘත්ති විපාක එකදිගට විඳින්නට නොදී බාධා කරන්නේ,
   (1) ආසන්න කර්මයෙනි. (2) උපත්ථම්භක කර්මයෙනි.
   (3) උපඝාතක කර්මයෙනි. (4) උපපීලක කර්මයෙනි.

21. මිහිඳු මහරහතන් වහන්සේගේ අදහස පරිදි ලක්දිව බුදුසසුන ස්ථිර ලෙස ම මුල්බැසගන්නා ලද්දේ,
   (1) ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපණයෙන් පසුව ය.
   (2) මහමෙව්නා උයන පූජා කිරීමෙන් පසුව ය.
   (3) අරිට්ඨ කුමරු පැවිදි ව විනය සංගායනා කිරීමෙන් පසුව ය.
   (4) සර්වඥධාතූන් වහන්සේලා වැඩමවීමෙන් පසුව ය.

22. මහායාන බුදුදහමේ ඉගැන්වීමක් වන ත්‍රිකාය සංකල්පයේ සම්භෝගකාය ලෙස සඳහන් වන්නේ,
   (1) උසස් දහමෙන් පිරිසිදු කළ සිරුරයි. (2) බුද්ධත්වයේ අනුපම සුවය ලද සූක්ෂ්ම සිරුරයි.
   (3) මිනිසුන් අතර පෙනීසිටි මිනිස් සිරුරයි. (4) ඍද්ධි බලයෙන් මවා පෙන්වන සිරුරයි.

23. ධර්ම දේශනයකදී ශ්‍රාවකයාට එම දහම තහවුරු කරවීම දේශකයන් වහන්සේගේ ප්‍රධාන අපේක්ෂාවකි. ඊට අදාළ ව සච්චවිභංග සූත්‍රයේ සඳහන් කරුණු හතෙන් පට්ඨපනා යනුවෙන් දක්වන්නේ,
   (1) කරුණු විස්තරාත්මකව පැහැදිලි කිරීමයි. (2) හඳුනාගත් කරුණු තහවුරු කිරීමයි.
   (3) කරුණු සංක්ෂිප්තව නාමිකව දැක්වීමයි. (4) කරුණු විවෘත කර දැක්වීමයි.

24. මහාපරිනිබ්බාන සූත්‍රයේ "පොරාණ වජ්ජිධම්ම" ලෙස සඳහන් වන්නේ,
   (1) දස රාජධර්මයන් ය. (2) දසසක්විතිවත් ය.
   (3) සතර සංග්‍රහවස්තූන් ය. (4) සප්ත අපරිහානීය ධර්මයන් ය.

25. ධනිය කුටිකාර භික්ෂුව ආදිකම්මිකයා වූයේ පාරාජිකාපත්ති අතුරින්,
   (1) අදත්තාදාන පාරාජිකාපත්තියට ය. (2) මෙථුනධම්ම පාරාජිකාපත්තියට ය.
   (3) උත්තරිමනුස්සධම්ම පාරාජිකාපත්තියට ය. (4) මනුස්සවිග්ගහ පාරාජිකාපත්තියට ය.

26. දෙමාපියන්ගේ ආරයෙන් හිමි වූ ලක්ෂණ දරුවන්ට හිමි වේ. ඇතැම්විට දරුවන් මවට පියාට සමාන වෙති. මෙම ස්වභාවය ඇතිවන්නේ,
   (1) ධම්ම නියාමයට අනුව ය. (2) කම්ම නියාමයට අනුව ය.
   (3) චිත්ත නියාමයට අනුව ය. (4) බීජ නියාමයට අනුව ය.

27. "උපනීයති ලොකො අද්ධුවො" "අතාණො ලොකො අනභිස්සරො" ති යන පාඨ අන්තර්ගත සූත්‍රය වන්නේ,
   (1) මජ්ඣිමනිකායේ රට්ඨපාල සූත්‍රයයි. (2) අංගුත්තරනිකායේ පඨමදේව බ්‍රාහ්මණ සූත්‍රයයි.
   (3) සංයුත්තනිකායේ රාජ සූත්‍රයයි. (4) අංගුත්තරනිකායේ සම්මුඛීභාව සූත්‍රයයි.

28. තමාගේ කැමැත්ත අනුව පක්ෂග්‍රාහී වී කැමති පැත්ත ගැනීමෙන් පාපකර්ම සිදුකර ගනී නම් එය,
   (1) මෝහයෙන් අගතියට යෑමයි. (2) ද්වේශයෙන් අගතියට යෑමයි.
   (3) ඡන්දයෙන් අගතියට යෑමයි. (4) භයෙන් අගතියට යෑමයි.

29. අංගුත්තරනිකායේ පත්තකම්ම සූත්‍රයට අනුව අතිථිබලි යනුවෙන් හඳුන්වා ඇත්තේ,
   (1) ඥාතිමිත්‍රාදීන් වෙනුවෙන් කරන සැලකිලි ය.
   (2) ආගමික කටයුතු සඳහා කරන සැලකිලි ය.
   (3) මියගිය ඥාතීන් වෙනුවෙන් කරන සැලකිලි ය.
   (4) ආගන්තුකයින් වෙනුවෙන් කරන සැලකිලි ය.

30. සතුරන් නසන රණශූරයකු සේ තමා තුළම වූ කෙලෙස් සතුරන් නැසූ හෙයින් ද සංසාර චක්‍රයේ ගරාදි හෙවත් පටිච්චසමුප්පාදයේ අවිද්‍යාදී ධර්ම සිඳලූ හෙයින් ද බුදුරජාණන් වහන්සේ,
(1) සම්මාසම්බුද්ධ නම් වන සේක. (2) අරහං නම් වන සේක.
(3) සුගත නම් වන සේක. (4) ලෝකවිදූ නම් වන සේක.

31. රාජ චරිතය, විනය කතිකාවත, සත්‍යවිලාසිනී ආදී ග්‍රන්ථ රචනා කර ඇති නූතන මහා යතිවරයාණන් වහන්සේ
(1) රත්මලානේ ධම්මාලෝක නාහිමි ය. (2) හික්කඩුවේ සුමංගල නාහිමි ය.
(3) හේන්පිටිගෙදර ඤාණසීහ නාහිමි ය. (4) රේරුකානේ චන්දවිමල නාහිමි ය.

32. දරවලින් ගිනිගොඩක් හෝ පහනක් පිළියෙල කොට කවාකාර සිදුරක් ඇති තහඩුවක් වැනි යමක් ඒ සමීපයෙහි තබා එම සිදුරෙන් එන ආලෝකය අරමුණු ලෙස ගෙන සිදු කරන භාවනාව වන්නේ,
(1) ආපෝ කසිණ භාවනාවයි. (2) පඨවි කසිණ භාවනාවයි.
(3) තේජෝ කසිණ භාවනාවයි. (4) වායෝ කසිණ භාවනාවයි.

33. සුඛිත සත්ත්වයන්ගේ සැපය දැක ඊර්ෂ්‍යා නොකොට සතුටුවෙමින් ඉතා සුවපහසු ලෙස සම්පත් ඇතිව වාසය කරන පුද්ගලයන් කෙරෙහි සතුටු ඇසින් බලමින් සිදු කරන්නේ,
(1) මෙත්තා භාවනාවයි. (2) කරුණා භාවනාවයි.
(3) උපේක්ඛා භාවනාවයි. (4) මුදිතා භාවනාවයි.

34. අරමුණු සුභ වශයෙන් බලනවිට බලවත් ආශාව ඇති වේ. ඒ අනුව ඇලීම ඇතිවූ දෙය "මම ය මාගේ යැ"යි දැඩිකොට ගැනීමේ ස්වභාවය හඳුන්වන්නේ,
(1) ව්‍යාපාදය ලෙස ය. (2) විචිකිච්ඡාව ලෙස ය.
(3) කාමච්ඡන්දය ලෙස ය. (4) ථිනමිද්ධ ලෙස ය.

35. ගුජරාටි, මස්කි, බ්‍රහ්මගිරි වැනි සෙල්ලිපිවලට අනුව සංඝයා නිරන්තරයෙන් ඇසුරු කරමින් ධර්මය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගත්තේ,
(1) චන්ද්‍රගුප්ත රජතුමා ය. (2) මහා අක්බාර් රජතුමා ය.
(3) බින්දුසාර රජතුමා ය. (4) අශෝක රජතුමා ය.

36. "ගංගානම් නදියේ දකුණු තීරයේ සිට උතුරු තීරය දක්වා දන්දෙමින් යාගහෝම පවත්වමින් ගියත් සිදුවන පිනක් නැත" යන ඉගැන්වීම කළ ශාස්තෘවරයා,
(1) මක්ඛලිගෝසාලයන් ය. (2) පූර්ණ කාශ්‍යපයන් ය.
(3) අජිතකේසකම්බලයන් ය. (4) නිගණ්ඨනාතපුත්තයන් ය.

37. සද්ධර්මයේ සුරක්ෂාව හා චිරපැවැත්ම සඳහා සංයුත්තනිකාය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාමට පවරන ලද්දේ,
(1) මහාකාශ්‍යප තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට ය.
(2) ආනන්ද තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසකට ය.
(3) සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය පිරිසට ය.
(4) අනුරුද්ධ තෙරුන් ප්‍රමුඛ ශිෂ්‍ය පිරිසට ය.

38. සම්බුද්ධ ශාසනයේ උපසම්පදා විනය කර්මය පිළිබඳව කියවෙන වැරදි ප්‍රකාශය වන්නේ,
(1) උපසම්පදාව ලැබීමට මව්පිය අවසරය තිබිය යුතු ය.
(2) උපසම්පදාව ලැබීමට පාත්‍රා සිවුරු සම්පූර්ණ වී තිබිය යුතු ය.
(3) උපසම්පදාව ලැබීමට පැවිද්දෙන් වසර විස්සක් සම්පූර්ණ විය යුතු ය.
(4) උපසම්පදාව ලැබීමට ආචාර්ය උපාධ්‍යායන් වහන්සේ සිටිය යුතු ය.

39. අභිධර්මයේ චෛතසික පරමාර්ථයේ එන අනොත්තප්ප චෛතසිකය අයත් වන්නේ,
(1) අන්‍යසමාන චෛතසිකයන්ට ය. (2) අකුසල චෛතසිකයන්ට ය.
(3) පකිණ්ණක චෛතසිකයන්ට ය. (4) සෝභන චෛතසිකයන්ට ය.

40. නිධිකණ්ඩ සූත්‍රයට අනුව අඹුදරුවන්, දැසිදසුන්, යානවාහන, ඇතුන්, අසුන් ආදී වස්තුව අයත් වන්නේ,
(1) ජංගම නිධානයට ය. (2) ථාවර නිධානයට ය.
(3) අංගසම නිධානයට ය. (4) අනුගාමික නිධානයට ය.

***

**2.1.3** I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 2 | 21. | 3 |
| 02. | 3 | 22. | 2 |
| 03. | 4 | 23. | 2 |
| 04. | 4 | 24. | 4 |
| 05. | 2 | 25. | 1 |
| 06. | 2 | 26. | 4 |
| 07. | 4 | 27. | 1 |
| 08. | 1 | 28. | 3 |
| 09. | 3 | 29. | 4 |
| 10. | 4 | 30. | 2 |
| 11. | 1 | 31. | 1 |
| 12. | 2 | 32. | 3 |
| 13. | 3 | 33. | 4 |
| 14. | 4 | 34. | 3 |
| 15. | 1 | 35. | 4 |
| 16. | 2 | 36. | 2 |
| 17. | 2 | 37. | 1 |
| 18. | 3 | 38. | 3 |
| 19. | 1 | 39. | 2 |
| 20. | 4 | 40. | 1 |

වගුව 5

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.**

## 2.1.4 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශතයක් ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | Missing |
| 1 | 2 | 20.45 | 51.06 | 9.70 | 18.18 | 0.61 |
| 2 | 3 | 9.85 | 20.91 | 65.30 | 3.33 | 0.61 |
| 3 | 4 | 6,36 | 47.88 | 18.33 | 26.06 | 1.37 |
| 4 | 4 | 4.24 | 7.12 | 5.30 | 82.88 | 0.46 |
| 5 | 2 | 15.00 | 70.15 | 8.03 | 6.67 | 0.15 |
| 6 | 2 | 15.30 | 77.12 | 4.85 | 2.42 | 0.31 |
| 7 | 4 | 27.88 | 9.09 | 21.67 | 40.61 | 0.75 |
| 8 | 1 | 51.52 | 14.24 | 17.12 | 16.82 | 0.30 |
| 9 | 3 | 15.45 | 10.30 | 66.52 | 7.42 | 0.31 |
| 10 | 4 | 5.61 | 10.15 | 16.67 | 67.42 | 0.15 |
| 11 | 1 | 87.12 | 8.64 | 1.67 | 2.12 | 0.45 |
| 12 | 2 | 4.09 | 82.73 | 4.24 | 8.33 | 0.61 |
| 13 | 3 | 16.21 | 12.73 | 50.61 | 19.39 | 1.06 |
| 14 | 4 | 12.27 | 13.18 | 28.48 | 45.76 | 0.31 |
| 15 | 1 | 43.18 | 23.79 | 21.36 | 10.76 | 0.91 |
| 16 | 2 | 9.70 | 63.33 | 11.52 | 15.00 | 0.45 |
| 17 | 2 | 31.52 | 22.58 | 19.39 | 25.45 | 1.06 |
| 18 | 3 | 19.55 | 43.64 | 26.52 | 9.39 | 0.90 |
| 19 | 1 | 21.52 | 27.12 | 33.94 | 16.67 | 0.75 |
| 20 | 4 | 15.30 | 24.55 | 20.00 | 38.79 | 1.36 |
| 21 | 3 | 24.85 | 5.61 | 58.03 | 11.06 | 0.45 |
| 22 | 2 | 21.97 | 36.36 | 20.76 | 20.00 | 0.91 |
| 23 | 2 | 38.33 | 24.24 | 22.42 | 14.09 | 0.92 |
| 24 | 4 | 18.33 | 17.88 | 11.21 | 51.52 | 1.06 |
| 25 | 1 | 76.06 | 10.30 | 5.15 | 7.58 | 0.91 |
| 26 | 4 | 10.30 | 17.58 | 10.00 | 61.67 | 0.45 |
| 27 | 1 | 35.45 | 30.91 | 20.61 | 11.97 | 1.06 |
| 28 | 3 | 20.76 | 17.42 | 54.24 | 7.27 | 0.31 |
| 29 | 4 | 10.91 | 13.33 | 20.61 | 54.24 | 0.91 |
| 30 | 2 | 29.70 | 41.21 | 15.61 | 11.82 | 1.66 |
| 31 | 1 | 39.39 | 21.82 | 16.67 | 20.45 | 1.67 |
| 32 | 3 | 19.39 | 18.48 | 45.91 | 15.91 | 0.31 |
| 33 | 4 | 23.33 | 27.12 | 29.85 | 18.94 | 0.76 |
| 34 | 3 | 11.67 | 10.00 | 61.36 | 16.21 | 0.76 |
| 35 | 4 | 5.61 | 8.79 | 11.06 | 73.94 | 0.60 |
| 36 | 2 | 20.45 | 33.48 | 21.97 | 22.73 | 1.37 |
| 37 | 1 | 40.76 | 17.27 | 29.55 | 11.36 | 1.06 |
| 38 | 3 | 57.42 | 10.61 | 25.45 | 5.76 | 0.76 |
| 39 | 2 | 27.58 | 34.09 | 17.58 | 20.00 | 0.75 |
| 40 | 1 | 48.18 | 14.39 | 17.73 | 19.24 | 0.46 |

වගුව 6

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

### 2.1.5 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

- I ප්‍රශ්න පත්‍රයේ පහසුතාව 40% ඉක්ම වූ ප්‍රශ්න සංඛ්‍යාව 27කි. 40%ට අඩු පහසුතාවක් පෙන් වූ ප්‍රශ්න සංඛ්‍යාව 13කි.

- තුන්වන ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ "මනෝමය ඉද්ධි ඤාණය" පිළිබඳවයි. ඒ සඳහා නිවැරදි පිළිතුර වන 4වන වරණය තෝරා ගෙන ඇති පිරිස 26.06%කි. නමුත් 2වන වරණය නිවැරදි පිළිතුර ලෙස 47.88%ක් තෝරාගෙන ඇත. මීට හේතුව වී ඇත්තේ ''මනෝමය ඉද්ධි ඤාණය''යන්නෙන් අදහස් කරන්නේ 2වන වරණයේ පිළිතුර වන "අනුන්ගේ සිත් හා සිතිවිලි" යන අර්ථය වැරදි ලෙස වටහා ගෙන තිබීමයි.

- 7වන ප්‍රශ්නය හෙළටුවා පිළිබඳ සකස් වී ඇත. ඒ සඳහා නිවැරදි පිළිතුර වන 4වන වරණය තෝරාගෙන ඇති පිරිස 40.61%ක් වේ. මෙම ප්‍රශ්නය සඳහා සාධනය අඩු වීමට හේතුව පෙළ පොතට මෙම පාඩම් කොටස අලුතින් එක්වීම නිසා ගුරු සිසු දෙපිරිසටම ඒ පිළිබඳව ඇති අඩු අවධානය විය හැකිය.

- 14වන ප්‍රශ්නයේ පහසුතාවය 45.76%කි. නමුත් 3වන වරණය නිවැරදි පිළිතුර ලෙස 28.48%ක් තෝරා ගෙන ඇත. වැරදි වරණයක් තෝරා ගැනීමට හේතු වී ඇත්තේ ප්‍රශ්නයේ **"වැරදි ප්‍රකාශය"** යන්න පිළිබඳ අවධානය යොමු කර නොමැති වීම විය හැකිය.

- 15වන ප්‍රශ්නය මතකය පිරික්සීම සඳහා සකස් කර ඇත. නමුත් මෙහිදී එකම ආකාරයේ මුල්පද 4ක් සහිත ගාථා පිළිතුර ලෙස ඉදිරිපත් කිරීමෙන් අපේක්ෂකයා ව්‍යාකුලත්වයට පත් වීමෙන් වැරදි නිගමනවලට එළඹ තිබේ. එබැවින් මෙම ප්‍රශ්නයේ පහසුතාවය 43.18%ක අඩු අගයක් ගැනීමටත් 2, 3වන වරණ තෝරාගත් අපේක්ෂක පිරිස පිළිවෙළින් 23.79%ක් හා 21.36%ක් වීමටත් හේතු වී ඇත.

- 17, 18, 19, 20 යන ප්‍රශ්නවල පහසුතාව 40%ට අඩු අගයක් ගෙන ඇත. එයට හේතු වී ඇත්තේ අපේක්ෂකයන් පෙළ පොත මනාව අධ්‍යයනය නොකිරීම වේ. සිසුන්ට ප්‍රියජනක ලෙස මෙම විෂය කොටස් ඉගැන්වීමෙන් ද සිසුන් විසින් මෙම විෂය කරුණු හොඳින් අවධාරණය කරගෙන ඉගෙනීම මගින් ද මෙම ප්‍රශ්න සඳහා පහසුතාව ඉහළ නැංවිය හැක.

- 23වෙනි ප්‍රශ්නයේ පහසුතාව 24.24%ක් වේ. 1 හා 3 නිවැරදි පිළිතුරු ලෙස තෝරාගත් අපේක්ෂක පිරිස පිළිවෙළින් 38.33%ක් හා 22.42%ක් වේ. මෙම ප්‍රශ්නය සඳහා මෙවැනි අඩු පහසුතාවක් පෙන්වීමට හේතු වී ඇත්තේ පෙළ පොතට අලුතින් එක් කළ පාඩමක් වීමත් සූත්‍ර ධර්මවල අන්තර්ගතය පිළිබඳ මැනවින් අධ්‍යයනය නොකිරීමත් වේ.

- 27වන ප්‍රශ්නය ද 23වන ප්‍රශ්නය මෙන් සූත්‍ර ධර්මවල අන්තර්ගතය පිළිබඳ අපේක්ෂකයන් තුළ ඇති අඩු දැනුම හේතුවෙන් පහසුතාවය 35.45%ක් වැනි අඩු අගයක් ගෙන ඇත.

- 33වන ප්‍රශ්නයේ පහසුතාව 18.94%කි. ඊට හේතු වී ඇත්තේ අපේක්ෂකයින් තුළ සතර බ්‍රහ්ම විහරණ ධර්ම කරුණු පිළිබඳ නිවැරදි කරුණු අවබෝධයක් නොමැති වීම විය හැකිය. 36 වෙනි ප්‍රශ්නයේ ද පහසුතාව 21.97%ක් වේ. 33 හා 36වන ප්‍රශ්න සරල දහම් කරුණු වුවත් සිසුන් මේ පිළිබඳ අඩු සැලකිල්ලක් දක්වා තිබීම පහසුතාවය අඩු වීමට හේතුවක් විය හැකිය.

- 38වන ප්‍රශ්නයේ පහසුතාව 25.45%ක් වේ. නමුත් නිවැරදි පිළිතුර පළමු වරණය ලෙස තෝරා ඇති අපේක්ෂක පිරිස 57.42%ක් වේ. වැරදි ප්‍රකාශය තේරීමට අවස්ථාව ලබා දීමෙන්, හා ප්‍රශ්නය මැනවින් කියවා තේරුම් ගෙන නොතිබීමෙන් ඉහළ ප්‍රතිශතයක අපේක්ෂක පිරිසක් මෙම වරණය තෝරා ඇති බව සිතිය හැකිය.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**II පත්‍රය - කාලය : පැය 03යි**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය. ප්‍රශ්න හතකින් ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය

I කොටස - **පළමුවන** ප්‍රශ්නය අනිවාර්යය වේ. කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න 10 කින් සමන්විත ය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20 කි.

II කොටස - ව්‍යුහගත රචනා ප්‍රශ්න **තුනකින්** සමන්විත වන අතර ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටසේ ප්‍රශ්නවලින් බුද්ධ චරිතය, චරිත කතා, ශාසන ඉතිහාසය, විනය යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය කෙරේ. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලකුණු 20කි.

III කොටස - ව්‍යුහගත රචනා ප්‍රශ්න **තුනකින්** සමන්විත වන අතර ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටසේ ප්‍රශ්නවලින් සූත්‍ර, භාවනා, අභිධර්මය, ධම්ම පදය හා මූලික ඉගැන්වීම් යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය කෙරේ.
එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලකුණු 20 කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 20 + 20 + 20 = 60

| අවසාන ලකුණු ගණනය කිරීම | : | I පත්‍රය | = | 40 |
|---|---|---|---|---|
| | | II පත්‍රය | = | 60 |
| | | අවසාන ලකුණු | = | 100 |

**2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය සහ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**

**1 ප්‍රශ්නය**

**1. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

**(i) නව ලොව්තුරු දහම 'සන්දිට්ඨික' යැයි පැවසීමට හේතු දෙකක් දක්වන්න.**

1) ආර්ය මාර්ගය සන්දිට්ඨික වන බව
2) නව ලොව්තුරා දහම ද තමාගේම ඥානයෙන් අවබෝධ කළ යුතු බැවිනි

**(ලකුණු 02යි)**

**(ii) බුදුගුණ අලංකාරයෙහි 'රහසත් පව් නොකොට කෙලෙසරයනුත් දුරුකොට' යන පද්‍ය පද දෙකින් පැවසෙන බුදුගුණය හා එහි අර්ථ ලියා දක්වන්න.**

අරහං බුදු ගුණය
රහසින්වත් පවු නොකිරීම හා කෙලෙස් සතුරන් නැසීම

**(ලකුණු 02යි)**

**(iii) රූප උපදවන හේතු රූප සමුට්ඨාන නමින් හැඳින්වේ. එයින් දෙකක් නම් කරන්න.**

i. කම්ම ii. චිත්ත iii. උතු iv. ආහාර

**(ලකුණු 02යි)**

**(iv) දුක්ඛසමුදය ආර්ය සත්‍යය නම් වූ තෘෂ්ණාව තෙවැදෑරුම් වේ. එයින් කාමතණ්හා හා භවතණ්හා දෙක හඳුන්වන්න.**

1) ඇස කණ නාසය දිව ශරීරය යන පඤ්ච ඉන්ද්‍රියන්ට විෂය වන රූප, ශබ්ද, ගන්ධ රස ස්පර්ශ යනාදිය පිළිබඳ ඇලීම කාම තණ්හාවයි.
2) භවය සදාකාලික ලෙස සිතීම භවයට ආශා කිරීම හා සදාකාලික ලෙස ජීවත් වීමට ආශා කිරීම භව තණ්හාවයි.

**(ලකුණු 02යි)**

**(v) සංඝාදිසේසාපත්තියකට පත් භික්ෂුවකට හෝ භික්ෂුණියකට කළ හැකි පිළියම් දෙකක් ඉදිරිපත් කරන්න.**

1) වස් සමාදනය
2) මානත් පිරීම
3) අබ්භාන කර්මය

**(ලකුණු 02යි)**

**(vi) ශ්‍රාවකයන් වහන්සේලා අතරින් මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ලැබූ අගතනතුර නම් කොට එම තනතුර පිරිනැමීට හේතු දක්වන්න.**

1) ධුතාංගධාරී භික්ෂූන් වහන්සේ අතර අගතනතුර ලැබීම.
2) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ තෙලෙස් ධුතාංග සමාදන්ව සත් දිනක් පුහුදුන්ව සිට අටවැනි දින සිව්පිළිසිඹියා සහිතව මහරහත් බවට පත් වූහ. දිවි හිමියෙන්ම පිණ්ඩපාතයෙන් යැපීම, දිවි හිමියෙන් වනගතව විසීම ආදී දුෂ්කර පිළිවෙත් (ධුතාංග/දුෂ්කර ව්‍රත) සමාදන්වීම.

**(ලකුණු 02යි)**

**(vii) දුක පිළිබඳ පටිච්චසමුප්පාද සිද්ධාන්තයට අයත් අංග අතරින් 'අවිජ්ජා පච්චයා සංඛාරා - අවිද්‍යාව හේතුවෙන් සංස්කාර වේ' යන්නෙහි අවිජ්ජා හා සංඛාර හඳුන්වන්න.**

1) චතුරාර්ය සත්‍ය පිළිබඳ නොදැනීම අවිජ්ජා හෙවත් අවිද්‍යාව යි.
2) තිදොරින් රැස් කරන කුසල් හා අකුසල් සංඛාර හෙවත් සංස්කාරයි.

**(ලකුණු 02යි)**

(viii) නිධානයක ප්‍රයෝජන දක්වන බුදුරජාණන් වහන්සේ 'රාජතො වා දුරුත්තස්ස - චොරතො පීළිතස්ස වා' යන ගාථාපද දෙකින් දක්වා ඇති නිධානයකින් වළකන විපත්ති දෙක පෙන්වා දෙන්න.

1) රජුන්ගේ දණ්ඩනයෙන් මිදීම පිණිස.
2) සොර, සතුරු, පීඩාවකදී, ඔවුන්ගෙන් නිදහස් වීම පිණිස.

**(ලකුණු 02යි)**

(ix) 'එකං අත්ථපදං සෙය්‍යො - යං සුත්වා උපසම්මති - යමක් අසා රාගාදී කෙලෙසුන් සංසිඳේ නම් එබඳු අර්ථවත් එක් පදයක් වුවද අසන්නාට ලැබීම උතුම් වේ.' මෙහි 'අත්ථපදං' යන්නෙන් අදහස් කරන දහම්පද වර්ග දෙකක් නම් කරන්න.

i. චතුරාර්ය සත්‍යය    ii. පටිච්ච සමුප්පාදය
iii. සතර සතිපට්ඨානය    iv. ස්කන්ධ, ධාතු, ආයතන, ආදිය.

**(ලකුණු 02යි)**


කර්මය, ත්‍රිලක්ෂණ, ආර්ය අෂ්ටාංගික මාර්ගය

(x) විනය පිටකයේ අන්තර්ගතය මුලින් ම බෙදා දක්වන මූලික බෙදීම් තුනෙන් දෙකක් ලියා දක්වන්න.

1) උභතො විභංග
2) ඛන්ධ
2) පරිවාර

**(ලකුණු 02යි)**
**(මුළු ලකුණු 02×10 = 20යි)**


**1වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




II පත්‍රයේ පළමු ප්‍රශ්නය වන මෙය සියලුම අපේක්ෂකයන් පිළිතුරු සැපයිය යුතු අනිවාර්ය ප්‍රශ්නයක් වේ. එසේ වුවද මේ සඳහා පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 88.31%කි. මෙම ප්‍රශ්නයට අනු කොටස් 10ක් ඇතුළත් අතර ඒ සඳහා ලකුණු 20ක් හිමිවේ. ඉන්

ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 5%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11 ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 33%ක් වන අතර ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 67%ක් වේ.




- II පත්‍රයේ පළමු ප්‍රශ්නය කොටස් 10කින් සමන්විතය (i) කොටස සඳහා පහසුතාව 17%කි. (i) කොටසින් විමසන පාලි පාඨය පිළිබඳ අර්ථය බහුතරයක් අපේක්ෂකයන් අවබෝධ කරගෙන නොසිටීම නිසා නියමිත පිළිතුරු දීමට අපොහොසත් වී ඇති බව කිව හැකිය.

- (ii) කොටසට සියලුම අපේක්ෂකයින් හොඳින් පිළිතුරු සපයා තිබුණි. එහි පහසුතාව 82%කි. 1 ප්‍රශ්නයේ කොටස් අතරින් වැඩිම පහසුතාවක් දක්වා ඇත්තේ මේ සඳහාය.

- (iii) වෙනි කොටස සඳහා ද පෙළපොත් භාවිතය, ධර්ම ග්‍රන්ථ පරිශීලනය මදකම නිසා නිවැරදි පිළිතුරු සැපයීමට බොහෝ අපේක්ෂකයෝ අසමත් වී ඇත. එහි පහසුතාව 34%කි.

- (iv) වෙනි කොටසට සාර්ථක පිළිතුරු අපේක්ෂකයින් ලබා දී ඇත. එහි පහසුතාව 63%කි.

- (v) වෙනි කොටසේ දී ද සාර්ථක පිළිතුරු දීමට අපේක්ෂකයින් අපොහොසත් වී ඇත. ඊට හේතු වීඇත්තේ ශාසනික විනය පිළිබඳ ධර්ම කරුණු ගැන ශිෂ්‍යයන්ගේ දැනුවත්භාවය අඩු වීමයි. එහි පහසුතාව 40%කි.

- (vi) හෝ (vii) ප්‍රශ්න පහසු වුවත් පෙළපොත් භාවිතයේ දුර්වලතා හේතුවෙන් සාර්ථක පිළිතුර සැපයීමට අපේක්ෂකයින් අපොහොසත් වී ඇත. එහි පහසුතාව පිළිවෙලින් 45%ක් හා 34%ක් වේ.

- (viii) වෙනි කොටසට ද අපේක්ෂකයින් සමාන්‍ය මට්ටමට පිළිතුරු සපයා ඇත. එහි පහසුතාව 45%කි.

- (ix) වෙනි කොටස ද පහසුතාව අඩු අගයක් ගන්නා අතර එහි පහසුතාව 12%කි. 1 ප්‍රශ්නයේ අඩුම පහසුතාවක් පෙන්වා ඇත්තේ මෙම අනුකොටස සඳහාය. ධම්ම පද ගාථා පදවල අර්ථයට අවධානය යොමු කරමින් ඉගැන්වීම් කටයුතුවල නිරත වීමෙන් මෙවැනි ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට හුරුව ලබාදිය හැකිය.

- (x) වෙනි කොටස පහසු ප්‍රශ්නයක් වුවත් පෙළපොත් පරිශීලනය නොකිරීම නිසා නිශ්චිත කරුණක් විමසීමේදී පිළිතුරු දීමට අපේක්ෂකයින් අසමත් වී ඇත. එහි පහසුතාව 49%කි.

- ත්‍රිපිටකයේ ඇතුළත් සූත්‍ර ,විනය අභිධර්ම යන තුන් පිටකයෙන්ම (1) ප්‍රශ්නයේ ප්‍රශ්න කොටස් ගොනු වී ඇත

- (i) ,(ii), (iv),(vi),(vii),(viii),(ix) ප්‍රශ්න සූත්‍ර පිටකය ඇසුරින් සකස් කර ඇති අතර (ii),(iv),(vi),(viii),ප්‍රශ්න සඳහා සිසුන් 40%කට වැඩි පහසුතාවක් පෙන්නම් කර ඇත. (i),(vii),(ix) ප්‍රශ්න සඳහා සිසුන් 40%ක ට වඩා අඩු පහසුතාවක් පෙන්වා ඇත. මෙම ප්‍රශ්න සම්බන්ධ විෂය කරුණු පිළිබඳ සිසුන්ගේ අවධානය අඩු වී ඇති අතර සිසුන් උනන්දු කර වීමට ගුරුවරුන් කටයුතු කළ යුතුව ඇත.

- (v),(x) ප්‍රශ්න විනය පිටකය ඇසුරින් සකස් කර ඇති අතර ඒ සඳහා 40%ක ට වැඩි පහසුතාවක් පෙන්නුම් කර ඇත. තව දුරටත් සිසුන්ගේ සාධන මට්ටම වැඩි කිරීම සඳහා දිරිමත් කළ යුතුව ඇත.

- (iii) කොටස අභිධර්ම පිටකය ඇසුරින් සකස් කර ඇති අතර 34%ක අඩු පහසුතාවක් ලබා ඇත. අභිධර්මය ඉගැන්වීම සඳහා තව දුරටත් වැඩි අවධානයක් යොමු විය යුතුය.

## II කොටස

**2වන ප්‍රශ්නය**

**(i) බුදුරජාණන් වහන්සේගේ මහාකරුණා ගුණය ප්‍රකට කළ අවස්ථා දෙකක් නම් කරන්න.**

සුනීත සැඩොල් පුතු, දෙව්ලොව උපන් සැඩොල් ස්ත්‍රිය, මළකඳක බැඳ සිටි සෝපාක, හදවතිකා ඇතින්න, බණ ඇසුමට ගොස් ආහාර ලැබූ දුප්පතා, සෝවාන් වූ පේසකාර දුව, රජ්ජුමාලා මෙහෙකාරිය, තිස්ස භික්ෂුව, උදරාබාධයෙන් පෙළුණ භික්ෂුව මෙයින් අවස්ථා දෙකකි.

**(ලකුණු 02යි)**

**(ii) ඉහත (i) හි ඔබ විසින් සඳහන් කරන ලද එක් අවස්ථාවකට අදාළ කෙටි විස්තරයක් සපයන්න.**

I හි පිළිතුරට අනුව අවස්ථා එකක් විස්තර කොට තිබීම අපේක්ෂා කෙරේ.

**(ලකුණු 03යි)**

**(iii) කායිකව හා මානසිකව අසරණ බවට පත් වූ වික්ෂිප්ත මනසක් ඇතිව ක්‍රියාකළ ඇතැමුන්ගේ මනස ප්‍රකෘති ස්වභාවයට පත්කිරීම උදෙසා බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් දෙකක් උදාහරණ ඇසුරින් විස්තර කරන්න.**


- එකම පුතු මළ සොවින් තැවුණු කිසාගෝතමියට නොමළ ගෙදරකින් අබ මිටක් රැගෙන ඒමට යොමු කිරීම.
- ගුරුවරයාගේ නොමග යැවීමෙන් රුදුරු බවට පත් අංගුලිමාල දමනය කිරීම සඳහා "මහණ සිටුව" යැයි කී විට "මම සිටියෙමි. ඔබද සිටින්න" යැයි ප්‍රකාශ කිරීම.
- ජනපද කල්‍යාණිය විවාහ කර ගැනීමට සූදානමින් සිටි නන්ද කුමරු සෘද්ධියෙන් දිව්‍යලෝකයට කැඳවාගෙන ගොස් දෙවඟනන් පෙන්වීම.
- සිව් මසක් එක් ගාථාවක් පාඩම් කළත් පාඩම් කරගත නොහැකි වූ චුල්ලපන්ථක තෙරුන් කළකිරී ගෙදර යෑමට සූදානම් වූ අවස්ථාවේ 'රජෝ හරණං' යනුවෙන් පවසමින් කමටහන් ලබා දී රහත් බවට පත් කිරීම ආදී සිද්ධීන් අතරින් දෙකකි.

**(ලකුණු 05යි)**

**උදාහරණ එකට ලකුණු 03** **(මුළු ලකුණු 10යි)**

**උදාහරණ දෙකටම ලකුණු 05**


**2වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




II පත්‍රයේ II කොටසට අයත් ප්‍රශ්නයක් වන මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති ප්‍රතිශතය 82.34%කි. මේ ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ. මෙම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු 10 න්,

ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 07%ක් ද
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 13%ක් ද
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 60%ක් ද
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 73%ක් වන අතර 27%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




දෙවන ප්‍රශ්නය බුද්ධ චරිතය ඇසුරෙන් සකස් කර ඇත. 2වන ප්‍රශ්නයේ අනුකොටස් තුනටම 65%ක ට වැඩි පහසුතාවක් පෙන්නුම් කර ඇත. මෙහි (i) කොටස සඳහා පහසුතාව 88%කි. අඩුම පහසුතාව (iii) කොටස සඳහා පෙන්නුම් කර ඇති අතර එහි පහසුතාව 66%කි. සමස්තයක් ලෙස අපේක්ෂකයන් වැඩි ප්‍රතිශතයක් සාර්ථක ලෙස පිළිතුරු සපයා ඇත.

## 3වන ප්‍රශ්නය

**(i) 19 වැනි සියවසේ අගභාගයේ ධර්ම - ශාස්ත්‍රීය හා ශාසනික පුනරුදයට දායක වූ නූතන යතිවරයන් වහන්සේලා දෙදෙනෙකු නම් කරන්න.**

හික්කඩුවේ සුමංගල නා හිමි, රත්මලානේ ධම්මාලෝක නා හිමි, හේන්පිටගෙදර ඤාණසීහ නා හිමි, වේරුගොඩ චන්දවිමල නා හිමි මෙයින් දෙදෙනෙකි.
(පෙළ පොතට සීමා කර ඇත)

**(ලකුණු 02යි)**

**(ii) ඉහත (i) හි ඔබ විසින් සඳහන් කරන ලද එක් යතිවරයන් වහන්සේ නමකගේ සේවාව අගයන්න.**

**I හි පිළිතුරට අදාළව පිළිතුරට සකස් ව තිබීම අපේක්ෂා කෙරේ.**

**(ලකුණු 03යි)**

**(iii) ධර්ම ශාස්ත්‍රීය පුනරුදයෙහි ලා නූතන යතිවරයන් වහන්සේලා ආරම්භ කළ පිරිවෙන් ආයතන දෙකක් ඇසුරින් ශාස්ත්‍රීය සේවාව විස්තර කරන්න.**


හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි ආරම්භ කළ විද්‍යෝදය පිරිවෙන, රත්මලානේ ධම්මාලෝක නා හිමි ආරම්භ කළ විද්‍යාලංකාර පිරිවෙන, හේනපිටිගෙදර ඤාණසීහ නාහිමි ආරම්භ කළ රත්නපුර ශ්‍රී සුමන පිරිවෙන මේ අතරින් දෙකක් පදනම් කොට ශාස්ත්‍රීය සේවාව දක්වා තිබිය යුතුය.

**(ලකුණු 05යි)**

**පිරිවෙන් 1 ක් නම් ලකුණු 03**
**පිරිවෙන් 2ටම ලකුණු 05**

**(මුළු ලකුණු 10යි)**


**3වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




03 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 38.44%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිය.
ඉන්,

ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 52%ක් ද
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 33% ක් ද
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 5%ක් ද
ලකුණු 8 -10 ප්‍රාන්තරයේ 10%ක් ද

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 15%ක් වන අතර 85%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




ශාසන ඉතිහාසය හා චරිත කතා අදාළ කරගෙන සකස් වී ඇති ප්‍රශ්නයකි. මෙහි (i) කොටසෙහි පහසුතාව 33%ක්'ද (ii) කොටසෙහි පහසුතාව 15%ක් ද (iii) කොටසෙහි පහසුතාව 20%ක් ද වේ. II පත්‍රයේ II කොටසේ හා III කොටසේ ප්‍රශ්න අතරින් අඩුම පහසුතාවක් පෙන්නුම් කර ඇත්තේ මෙම ප්‍රශ්නයටයි. මීට හේතු වී ඇත්තේ නව විෂය නිර්දේශයට අනුව සකසන ලද පෙළ පොතට ඇතුළත් කරන ලද, නව චරිත කතා පිළිබඳ අවධානය යොමු කර නොමැති වීමය. එබැවින් පෙළපොතට අලුතින් ඇතුළත් කරන ලද නව විෂය කරුණුවලට වැඩි අවධානය යොමු කරමින් ඉගැන්වීම් කටයුතු සිදු කළ යුතුව ඇත.

**4වන ප්‍රශ්නය**

(i) **සප්ත ආපත්තිස්කන්ධ අතරින් ගරුකාපත්ති ගණයට අයත් ඇවැත්කඳු දෙක නම් කරන්න.**

i. පාරාජිකාපත්ති
ii. සංඝාදිසෙසාපත්ති

**(ලකුණු 02යි)**

(ii) **මෙථුනධම්ම පාරාජිකාපත්තිය ලියා එහි අර්ථය ඉදිරිපත් කරන්න.**

යො පන භික්ඛු භික්ඛූනං සික්ඛාසාජීව සමාපන්නෝ සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මෙථුන ධම්මං පතිසෙවෙය්‍ය. අන්තමසො තිරච්ඡාන ගතායපි පාරාජිකො හොති අසංවාසොති.

යම් භික්ෂුවක් භික්ෂූන් පිළිබඳ අධිශීල ශික්ෂාවන්ට පැමිණියේ උපසම්පදාව ප්‍රතික්ෂේප නොකොට දුර්වල බවද නොකියා යටත් පිරිසෙයින් තිරිසන් ගිය මාගමක් සමග ද මෙවුන්දම් සෙවී නම් පරිජි වූයේ වෙයි. උපසපන් භික්ෂූන් සමඟ සහවාසයට නුසුදුස්සෙකු වෙයි.

(පාලි පෙළට ලකුණු 01) **(ලකුණු 03යි)**


(iii) **උපසපන් භික්‍ෂුවහන්සේ නමකගේ භික්‍ෂුත්වය විෂයෙහි ප්‍රාතිමෝක්‍ෂ ශික්‍ෂා අතර පාරාජිකා ශික්‍ෂාවන්හි බලපෑම විස්තර කරන්න.**

ප්‍රාතිමොක්ෂ ශික්ෂා අතර පාරාජිකාපත්ති ගරුකාපත්ති ගණයට අයත් වේ. ගරුකාපත්ති අතර පාරාජිකාපත්ති ඡේද්‍යගාමිණී ශික්ෂා වේ. සිදීගිය ඇවතින් උපසම්පදාව හෙවත් භික්ෂුත්වය අහෝසි වේ. එවිට සාමණේරයෙකු ලෙස ජීවත් වීම හෝ ගිහි බවට පත් වී උපාසකයෙකු ලෙස කටයුතු කිරීමට සිදු වේ. මේ ඇසුරින් පිළිතුර සකස් වී තිබිම යුතුය.

(අර්ථයට ලකුණු 02) **(ලකුණු 05යි)**

**(මුළු ලකුණු 20යි)**


**4වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්‍ෂණ, නිගමන හා යෝජනා :**




04වන ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 50.65%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ. ඉන්

ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 8%ක් ද
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 20%ක් ද
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 18%ක් ද
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 54%ක් ද
ලෙස අපේක්‍ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6 හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්‍ෂකයන් ප්‍රතිශතය 72%ක් වන අතර 28%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන්ය.




විනය පිටකය අදාළ කරගනිමින් සකසන ලද ප්‍රශ්නයකි. (i) කොටස සඳහා පහසුතාව 50%ක් ද (ii) කොටස සඳහා පහසුතාව 84%ක් ද (iii) කොටස සඳහා පහසුතාව 62% ක් ද වේ. (i) කොටසේ සාධන මට්ටම අඩු වීමට හේතු ලෙස නිශ්චිතව බලාපොරොත්තු වන පිළිතුරක් වීමත් නව විෂය නිර්දේශයෙන් අලුතින් එකතු වී ඇති කොටස් වීමත්, විනය පිටකයේ පාඩමේ අවසානයෙන් අසා ඇති විෂය කරුණු නිසාත් සිසුන්ගේ හා ගුරුවරුන්ගේ අවධානය අඩු වීමත් ආදිය විය හැකි.

**III කොටස**

**5වන ප්‍රශ්නය**

**(i) 'න භජේ පාපකෙ මිත්තෙ' යන ගාථාව සම්පූර්ණ කරන්න.**

න භජේ පාපකෙ මිත්තෙ - න භජෙ පුරිසාධමෙ
භජෙථ මිත්තෙ කල්‍යාණෙ - භජෙථ පුරිසුත්තමෙ

**(ලකුණු 02යි)**

**(ii) එම ගාථාවේ අර්ථය සරල බසින් ලියන්න.**

පවිටු මිතුරන් ඇසුරු නොකරන්න. අධම හෙවත් ඉතා නරක පුද්ගලයන් ඇසුරු නොකරන්න. සත්පුරුෂ කල්‍යාණ මිතුරන් ඇසුරු කරන්න. ශීලයෙන්, ගුණයෙන්, තපසින් උතුම් පුරුෂයන් ඇසුරු කරන්න.


**(ලකුණු 03යි)**

**(iii) ''පාප මිත්‍ර ආශ්‍රය නිසා වරදට යොමු වන වර්තමාන තරුණ පිරිස් වෙත කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන්න'' යන්නෙන් ලබාදෙන උපදේශය සාකච්ඡා කරන්න.**

පාපමිත්‍ර ආශ්‍රය නිසා පුද්ගලයා වරදට යොමු වේ. එය දුශ්චරිතයටත්, අකුසල් සිදු කිරීමටත් මගකි. සමාජය තුළ වැරදි කරන්නන් නීතියේ රැහැනට ගොදුරු වේ. පරලොව වශයෙන් සතර අපාගත වීමට හේතු වේ. එබැවින් කල්‍යාණමිත්‍ර ආශ්‍රය අගය කරයි. කල්‍යාණමිත්‍ර ආශ්‍රය නිසා පුද්ගලයා සුමගට යොමු වේ. එය සමාජ සුචරිතයට මගයි. මෙලොව වශයෙන් කීර්ති, ප්‍රශංසා ලැබීමට හේතු වේ. පරලොව වශයෙන් සුගතියෙහි උපත ලැබීමට ද හේතු වේ. මේ ඇසුරෙන් ප්‍රමාණවත් පිළිතුරක් සකස් වී තිබීම අපේක්ෂා කෙරේ.

**(ලකුණු 05යි)**
**(මුළු ලකුණු 10යි)**

**5වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





05වන ප්‍රශ්නය තෝරා ගෙන ඇති පිරිස 80.78%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 ක් හිමිවේ. ඉන්

ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 5%ක් ද
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 14%ක් ද
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 22%ක් ද
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 59%ක් ද

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 81%ක් වන අතර 19% ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන්ය.




III කොටසේ I වෙනි ප්‍රශ්නය වන මෙය සූත්‍ර පිටකය අදාළ කරගෙන සකස් වී ඇති ප්‍රශ්නයකි. (i) කොටසෙහි පහසුතාව 95%ක් ද (ii) කොටසෙහි පහසුතාව 77%ක් ද (iii) කොටසෙහි පහසුතාව 69%ක් ද වේ. II පත්‍රයේ II හා III කොටස් ප්‍රශ්න අතරින් වැඩිම පහසුතාවක් පෙන්නුම් කර ඇත්තේ මෙම ප්‍රශ්නයට වන අතර එහි පහසුතාව 80.33%කි. සිසුන්ගේ සාධන මට්ටම ඉහළ තත්වයක පවතින අතර සිසුන් සාර්ථක ලෙස පිළිතුරු ඉදිරිපත් කර ඇති බව ප්‍රකාශ කළ හැකිය.

**06වන ප්‍රශ්නය**

**(i) සමථ භාවනාවට අදාළ කර්මස්ථාන ප්‍රභේද දෙකක් නම් කරන්න.**

i. සබ්බත්‍ථ කම්මට්ඨාන
ii. පාරිහාරිය කම්මට්ඨාන

**(ලකුණු 02යි)**

**(ii) දස අනුස්සති භාවනා අතුරින් දෙකක් නම් කොට ආනාපානසති භාවනාව කෙටියෙන් හඳුන්වන්න.**

බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දේවතානුස්සති, උපසමානුස්සති, මරණානුස්සති, කායගතානුස්සති, හා ආනාපානසති මෙයින් දෙකකි.
ආශ්වාස ප්‍රශ්වාස පිළිබඳව සිහිය පිහිටුවාගෙන සිත එකඟ කර ගැනීම ආනාපාන සති භාවනාවයි. මේ ගැන ප්‍රමාණවත් පිළිතුරක් අපේක්ෂිතයි.

නම් කිරීම ලකුණු 02
විස්තරයට ලකුණු 01

**(ලකුණු 03යි)**

**(iii) සමථ භාවනාව ප්‍රගුණ කිරීමෙන් පඤ්චනීවරණ ධර්ම යටපත් වන අයුරු දක්වා එහි ආනිසංස ලෙස පඤ්ච අභිඤ්ඤා හා අෂ්ට සමාපත්ති ලබන ආකාරය පෙන්වා දෙන්න.**

කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්දච්චකුක්කුච්ච, විචිකිච්ඡා යන ධර්මතා පහ නීවරණ ධර්මයි. සමථ භාවනාව වැඩීම තුළින් මේවා යටපත් වේ.

විතක්ක විචාර පීති සුඛ එකග්ගතා සහිත පඨමජ්ඣාන සිත
විචාර පිති සුඛ එකග්ගතා සහිත දුතියජ්ඣාන සිත


පීති සුඛ එකග්ගතා සහිත තතියජ්ඣාන සිත
සුඛ එකග්ගතා සහිත චතුත්‍ථජ්ඣාන සිත යන රූපාවචර ධ්‍යාන හතරයි.

ආකාසානඤ්චායතන සිත, ආකිඤ්චඤ්ඤායතන සිත, විඤ්ඤාණඤ්චායතන සිත හා නෙවසඤ්ඤානාසඤ්ඤායතන සිත යන අරූපාවචර ධ්‍යාන හතරයි.

ඉද්ධිවිධ ඤාණය, දිබ්බසොත ඤාණය, පරචිත්ත විජානන ඤාණය, පුබ්බෙ නිවාසානුස්සති ඤාණය, දිබ්බචක්ඛු ඤාණය, පඤ්ච අභිඤ්ඤාවෝය.

**(ලකුණු 05යි)**
**(මුළු ලකුණු 10යි)**


**6වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




06වන ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 42.6%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ. ඉන්

ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 35%ක් ද
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 9%ක් ද
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 37%ක් වන අතර 63%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන්ය.




සූත්‍ර පිටකය අදාළ කර ගනිමින් භාවනා පාඩම ඇසුරෙන් ප්‍රශ්නය සකස් වී ඇත. (i) කොටස සඳහා 5%ක් ද (ii) කොටස සඳහා 64%ක් ද (iii) කොටස සඳහා 39%ක ද පහසුතාවක් පෙන්නුම් කරයි. මෙහි (i) කොටස සඳහා ඉතාමත්ම අඩු පහසුතාවක් පෙන්වා ඇත. ත්‍රිපිටක ධර්ම 4 වසර පෙළපොතේ කර්මස්ථාන ප්‍රභේද දෙක වශයෙන් "සබ්බඨ කම්මට්ඨාන - පාරිහාරිය කමමට්ඨාන " දක්වා ඇත. ප්‍රශ්නයේ පිළිතුරට බලාපොරොත්තු වන්නේ ඉහත සඳහන් කම්මට්ඨාන දෙක පිළිබඳවයි. නමුත් සිසුන් මේ සඳහා පිළිතුරට පාදක කර ඇත්තේ සමසතලිස් කර්මස්ථාන පිළිබඳ කරුණුය. මෙම අඩු සාධනයට හේතුව ලෙස අපේක්ෂකයින් ප්‍රශ්නය අවබෝධ කර නොගෙන පිළිතුරු සපයා තිබීම දැක්විය හැකිය.

**07වන ප්‍රශ්නය**

**(i) 'එකුප්පාද නිරෝධා ච-එකාලම්බන වත්‍ථුකා-චෙතොයුත්තා ද්විපඤ්ඤාස - ධම්මා චෙතසිකා මතා' මෙහි දැක්වෙන් චෛතසික ලක්‍ෂණ හතර පෙන්වා දෙන්න.**

සිත සමගම ඉපදීම, සිත සමගම නැතිව යෑම.
සිතගත් අරමුණම ගැනීම, සිත සිටි තැනම සිටීම.

**(ලකුණු 02යි)**

**(ii) පනස් දෙකක් වූ චෛතසික ධර්ම රාශි වශයෙන් බෙදෙන කොටස් තුන ගෙනහැර දක්වන්න.**

i. අන්‍යසමාන රාශිය.
ii. අකුසල රාශිය (අසෝභන)
iii. සෝභන රාශිය (කුසල)


**(ලකුණු 03යි)**

**(iii) සබ්බචිත්තසාධාරණ චෛතසික නම් කොට ඒවා එනමින් හැඳින්වීමට හේතු දක්වන්න.**


ඵස්ස, වේදනා, සඤ්ඤා, චෙතනා, එකග්ගතා, ජීවිතින්‍ද්‍රිය, මනසිකාර අසූ නවයක් වූ සියලු සිත්වල මෙම චෛතසික සියල්ල යෙදේ. කුසල, අකුසල භේදයක් නැතිව සියලු සිත්වල එකසේ යෙදෙන බැවින් මේ සිතිවිලි හත සබ්බචිත්ත සාධාරණ නම් වේ.

**(ලකුණු 05යි)**
**(මුළු ලකුණු 10යි)**

**7වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





07 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 29.6%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිය. ඉන්
ලකුණු 0 - 2 ප්‍රාන්තරයේ 42%ක් ද
ලකුණු 3 - 5 ප්‍රාන්තරයේ 30%ක් ද
ලකුණු 6 - 7 ප්‍රාන්තරයේ 10%ක් ද
ලකුණු 8 - 10 ප්‍රාන්තරයේ 18%ක් ද
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 28%ක් වන අතර 72%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




අභිධර්ම පිටකය ඇසුරෙන් සැකසී ඇති ප්‍රශ්නයකි. (i) කොටස සඳහා පහසුතාව 53%කි. (ii) කොටස සඳහා පහසුතාව 55%කි. (iii) කොටස සඳහා පහසුතාව 37%කි. මතක ශක්තියෙන් පිළිතුරු ලබා දිය යුතු ප්‍රශ්නයකි. අපේක්ෂකයින්ගේ සාධන මට්ටම සාමාන්‍ය තත්වයක ඇත. මෙහි (iii) කොටසට සිසුන්ට සාර්ථකව පිළිතුරු දීමට නොහැකි වීමට හේතුව ලෙස අභිධර්ම පිටකයේ නිශ්චිත ධර්ම කොටස් මතකයේ රඳවා ගැනීමට නොහැකි වූ දුර්වලතාවය දැක්විය හැකිය.

### 2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන යෝජනා




ත්‍රිපිටක ධර්මය II පත්‍රය කොටස් තුනකින් යුක්තය. එහි I කොටසට අයත් පළමු ප්‍රශ්නයේ කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න 10ක් ඇතුළත් වේ. II කොටසට රචනා ප්‍රශ්න 3ක් ඇතුළත් අතර ඉන් ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ. III කොටසටද රචනා ප්‍රශ්න 3ක් ඇතුළත් අතර ඉන් ප්‍රශ්න දෙකකට ද පිළිතුරු සැපයිය යුතු වේ.

මෙහි අනිවාර්ය වූ පළමු ප්‍රශ්නය සූත්‍ර, විනය, අභිධර්ම යන තුන් පිටකයට ඇසුරෙන් සකස් වී ඇත. එම ප්‍රශ්නය අනිවාර්ය වුවද එයට පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 88.31%කි. එහි පහසුතාව 42%කි.

II පත්‍රයේ ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු II හා III කොටස් වල ප්‍රශ්න අතුරින් වැඩිම පහසුතාවක් පෙන්වා ඇත්තේ පිළිවෙලින් III කොටසට අයත් 5වන ප්‍රශ්නයට හා II කොටසට අයත් 2වන ප්‍රශ්නයටය 5වන ප්‍රශ්නය සූත්‍ර පිටකය අදාළ කරගෙන සකස් වී ඇති අතර එහි පහසුතාව 80.33%කි. III කොටසේ ප්‍රශ්න අතුරින් වැඩිම අපේක්ෂකයන් පිරිසක් තෝරා ගෙන ඇති ප්‍රශ්නය වන්නේ මෙම ප්‍රශ්නයයි. එම ප්‍රශ්නය තෝරා ගත් ප්‍රතිශතය 80.78%කි.

2වන ප්‍රශ්නය බුද්ධ චරිතය ඇසුරෙන් සකස් වී ඇති අතර එහි පහසුතාව 77.6%කි. එම ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 82.34%කි.

චරිත කතා හා ශාසන ඉතිහාසය ඇසුරෙන් සකස් කර ඇති ප්‍රශ්නය සඳහා අඩුම පහසුතාවක් පෙන්නුම් කර ඇති අතර එහි පහසුතාව 22.6%කි.

අභිධර්ම ඇසුරෙන් සකස් කර ඇති 7වන ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයින් ප්‍රතිශතය 29.61%ක් තරම් ඉතා අඩු අගයක් ගත්ත ද එහි පහසුතාව 48%කි.

III කොටස

## 3.0 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

**3.1** පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

- ප්‍රශ්න පත්‍රයේ පවත්නා මූලික උපදෙස් කියවා හොඳින් වටහා ගැනීමට උත්සාහය ගත යුතු ය.
- මුල් පිටුවේ විභාග අංකය, විෂය හා පත්‍රය ආදී සඳහන් කළ යුතු විස්තර අනිවාර්යයෙන්ම ඇතුළත් කළ යුතු ය.
- I පත්‍රයට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන පැහැදිලි එක් කතිර ලකුණක් (x) පමණක් යෙදිය යුතු ය.
- නිවැරදි හා පැහැදිලි අත්අකුරු භාවිතය ලකුණු ලබා ගැනීමට පහසු මාර්ගයකි.
- II පත්‍රයට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.
- සෑම පිටුවකම විභාග අංකය හා පිටු අංකය යෙදිය යුතු ය.
- අනිවාර්ය ප්‍රශ්න හා තෝරාගත් ප්‍රශ්න වශයෙන් ද කොටස් හා අනුකොටස් වශයෙන් ද ප්‍රශ්න හොඳින් කියවා පිළිතුරු ලිවීමට ගත වන කාලය නිසි ලෙස කළමනාකරණය කිරීම පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.
- II ප්‍රශ්න පත්‍රයේ III කොටසේ 6 ප්‍රශ්නයේ I කොටසට පිළිතුරු සැපයීමේදී ප්‍රශ්නය නිසිලෙස වටහා ගැනීමට සිසුන් අසමත් වී ඇති බවක් පෙනෙන්නට ඇති හෙයින් ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කරගෙන පිළිතුරු සැපයිය යුතු ය.
- ව්‍යූහගත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී ඇතැම් අපේක්ෂකයින් විචාරාත්මකව කරුණු ඉදිරිපත් කර ඇති බවක් නොපෙනේ. විෂය කරුණු සංවිධානාත්මකව ඉදිරිපත් කිරීමේ දුර්වලතා මග හරවා ගැනීමට කටයුතු කළ යුතු ය.
- පිළිතුරුපත් ඇමිණීමේ දී පිටු අංක පිළිවෙලට ඇමිණිය යුතු ය.

**3.2** ඉගෙනුම් ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා

- මතක ශක්තිය දුර්වල මට්ටමක පැවතීම පොදුවේ දක්නට ලැබෙන අතර කට පාඩම් කිරීමෙන් කවි ගාථා හා පාලි පාඨ මතකයේ රඳවා ගත යුතු ය.
- විෂයයට අදාළ කර ගත හැකි මූලාකෘති පරිහරණය කිරීමේ උනන්දුව වර්ධනය කර ගත යුතු ය.
- පෙළපොත් පරිශීලනය කිරීමේ උනන්දුව වැඩි කර ගත යුතු ය.
- නිර්මාණාත්මකභාවය මගින් ප්‍රකාශ ශක්තියේ දුර්වලතා මග හරවා ගැනීමට සතතභ්‍යාසයේ යෙදීමට උත්සාහ ගත යුතු ය.
- ධම්මපදය, සේඛියා, සූත්‍ර ධර්ම, අභිධර්ම යන අංශවල ගාථා සහ පාඨ නිවැරදි ලෙස උච්චාරණය කරමින් කීමට සහ ලිවීමට පුහුණු කළ යුතු ය.
- සූත්‍ර, විනය හා අභිධර්ම යන තුන්පිටකය පිළිබඳ සිසුන් තුළ ඇති අවබෝධය වර්ධනය කිරීමට කටයුතු කළ යුතු ය.
- ව්‍යූහගත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී විචාරාත්මකව හා කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීමට සිසුන් පුහුණු කළ යුතුය.
- පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර ආශ්‍රිතව සිසුන් ලවා අභ්‍යාස කරවා පුහුණුවක් ලබා දිය යුතු ය.